ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැ**බේ.**

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නමින් රාජ්‍ය බැංකු වල පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු 25කට අදාළ එකතුව රු.මිලියන 5.12 ක් ගිණුම් වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු පිළිබඳ තොරතුරු මාගේ සමාංක DSG/FIN/16/01-1 දරණ හා 2025.04.30 දිනැති ලිපියෙන් විගණනය වෙත ලබා දී ඇත.	භාණ්ඩාගාර උපදෙස් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට ස්ථාවර තැන්පතු, මූල්‍ය වත්කම් යටතේ ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.
(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි ඒකක 166 ක් තක්සේරු කර වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	තව දුරටත් තක්සේරු කර ගිණුම්ගත කිරිමට ඇති ඉඩම් හා ගොඩනැගිලි, තක්සේරු කිරිම සම්බන්ධ මූලික කටයුතු සිදුකරමින් පවතින අතර, එම තක්සේරු වාර්තා ලබාගත් පසු අදාල වත්කම් ගිණුම්ගත කිරිමට කටයුතු කරමි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉඩම්, ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ලබාගෙන එය මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ප්‍රකාරව නියාගම, ගෝනපීනුවල හා හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි වත්කම් වර්ගීකරණය නිවැරදිව සිදුකර නොතිබුණි.	ගෝනපීනුවල හා නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි නිවැරදි කේතයට වත්කම් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර, අක්මීමන හා ඇල්පිටිය යනාදී ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 03 තුල, පාසල් 15 ක් වසා දමා වසර 12 සිට වසර 24 ක කාලයක් ගත වී තිබුණ ද, මෙම ඉඩම් මැනුම් කර පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් ඵලදායී ප්‍රයෝජනය සඳහා යොදා ඇති බව හා වත්කම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	වත්කම් තක්සේරු කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කර වටිනාකම ගිණුම් ගත කළ යුතු අතර, ඵලදායී ආර්ථික කටයුත්තකට භාවිතා කිරීමටද කටයුතු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.මිලියන 4,677.57 ක් ලෙස දක්වා තිබුණු අතර, භාණ්ඩාගාර SA-90 වගුව එම වටිනාකම රු.මිලියන 4,687.08 ක් වූයෙන් රු.මිලියන 9.51 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත මේ වසරට අනුව යාවත්කාලීන වන අතර එය භාණ්ඩාගාර වෙතින් සිදුවූ වරදකි. ඒ පිළිබඳව දන්වා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් මගින් දැනුම් දී ඇත.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අදාල නිවැරදි කිරීම් භාණ්ඩාගාරය මගින් සිදුකර ගත යුතු අතර, ඉදිරියේදී කාලීනව සැසඳීම් සිදු කර නිවැරදි කිරීම් කරවා ගත යුතුය.
(ඊ)	**විගණන සාක්ෂි නොවීම**		
	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් විගණනයට ලද තොරතුරු අනුව දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී ඇති මෝටර් බයිසිකල් 42 ක් හා වෙනත් වාහන 05 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් විය.	එම මෝටර් බයිසිකල් දැනට භාවිතා කරනු ලබන පුද්ගලයින් හඳුනාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට අදහස් කර ඇත.	අදාල වාහන පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන තහවුරු කර ගැනීම සිදුකල යුතු අතර, විගණනයට ද ඉල්ලූ තොරතුරු කඩිනමින් ලබා දිය යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් වියදම් දැරීම සඳහා ශීර්ෂ 38 කින් ලද රු.මිලියන 4,510.84 ක ප්‍රතිපාදනවලින් 2024 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 391.39 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එලෙස වෙනත් ශීර්ෂ 16 ක් යටතේ ලැබී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම සියයට 10 සිට සියයට 62 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කරන ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අදාල වැය ශීර්ෂ යටතේ බෙදා හැරීමත් උපයෝජනය නොකළ ප්‍රතිපාදන නැවත අදාල වැය ශීර්ෂ යටතේම රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත හරවා යැවීමත් සිදු කරනු ලබයි.	ප්‍රතිපාදන උපරිම අයුරින් අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි උපයෝජනය කිරීමට හැකිවන පරිදි විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	කඳුකර දශකය 2024 – 2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ නෙළුව, නියාගම, තවලම හා නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 තුළ ව්‍යාපෘති 569 ක් වෙනුවෙන් රු.මිලියන 377.30 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 80 ක් හා වියදමින් සියයට 78 ක්ම ප්‍රවේශ මාර්ග සඳහා වැයකර තිබුණි. ව්‍යාපෘතියේ සම්පූර්ණ දරිද්‍රතා දර්ශක 10 ක් වූ අතර, ඉතිරි දර්ශක 09 සඳහා වැයකර තිබුණේ රු.මිලියන 83.02 ක් පමණි.	මෙම කලාපය තුල මාර්ග සංවර්ධනය සඳහා වන ඉල්ලීම් ඉහළ මට්ටමක පවති. ඉදිරි වර්ෂයන් හිදි එක් එක් අංශ යටතේ ප්‍රමුඛතාවය අනුව ක්‍රියාත්මක කිරීමට යෝජනා හඳුනාගෙන ඇත.	විධිමත් පරීක්ෂාවක් කර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති දශවිධ බහුමානික දරිද්‍රතා දර්ශක සියල්ල කෙරෙහි සාධාරණ බර තැබීමකින් තොරව ව්‍යාපෘති හඳුනා ගැනීම කළ පාර්ශ්ව වෙත පියවර ගැනීමත්, ඉදිරියේදී විධිමත් පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීමේ අධීක්ෂණය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය.
(ඇ)	ආහාර සුරක්ෂිතතාවය සඳහා, වන සතුන්ගෙන් සිදුවන හානි වැලැක්වීමට ගොවි සංවිධාන වෙත වායු රයිෆල් බෙදාදීමේ ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව, තවලම, නාගොඩ සහ නියාගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 හි ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි එකතුව රු.මිලියන 7.19 ක් වැය කරමින් ගොවි සංවිධාන 151 ක් අතරේ වායු රයිෆල් 160 ක් බෙදා දී තිබුණි. මෙම වායු රයිෆල් ලබාදීම ගොවි	මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු හරහා ඉදිරිපත් වූ යෝජනාවක් වූ අතර, ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය අනුව සක්‍රීය ගොවි සංවිධාන වෙත වායු රයිෆල් ලබාදී ඇති අතර ව්‍යාපෘතිය උපරිම ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරිමට නිරන්තර පසුවිපරම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යනු ලබන බවද සඳහන් කරමි.	විධිමත් වැඩපිළිවෙලක් යටතේ සමීපව අධීක්ෂණය කරමින් හා කාලීන පසු විපරම් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.

	සංවිධාන වල 10,340 ක් වූ සියළුම සාමාජිකයින්ගේ අවශ්‍යතාවය ඉටු කරන්නේ කෙසේ ද යන්නත්, සාමාජිකයින් වායු රයිෆල් භාර ගන්නා ආකාරය, ක්‍රියාත්මක කරන ආකාරය හා නැවත භාරදෙන ආකාරය සම්බන්ධ ක්‍රමවේදය පිළිබඳව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවධානය යොමු කර නොතිබුණි.		
(ඇ)	අඩු ආදායම්ලාභීන්ගේ හා සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ගෙවතු වගා ඉඩම්වල ඵලදායීතාවය නැංවීමේ අරමුණින් නෙළුව, තවලම, නියාගම හා නාගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශවල එක් ප්‍රතිලාභියෙකුට කුරුඳු පැළ 200 ක් බැගින් ප්‍රතිලාභීන් 4419 ක් අතරේ කුරුඳු පැළ 883,200 ක් ලබාදීම සඳහා රු.මිලියන 21.02 ක වියදමක් දරා තිබුණි. භෞතික නියැදි විගණන පරීක්ෂාවේ දී පැළ සාර්ථක වර්ධනයක් අත්කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතිය ප්‍රජා දායකත්වය සහිතව ක්‍රියාත්මක වන බැවින් රජයෙන් පැළ ලබාදීම පමණක් සිදුකල අතර නිරන්තරයෙන් ප්‍රතිලාභීන් වෙත උපදෙස් ලබාදීමට කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත.	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සමීපව අධීක්ෂණය හා පසු විපරම් කටයුතු සිදු කිරීමට වැඩපිළිවෙලක් යොදා අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට කටයුතු කළ යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය විධිවිධාන** ----------------------------				
(i)	XXIV පරිච්ඡේදයේ 4 හා 6 වගන්ති	1 කොටසේ 216,961	විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු වසරකට වැඩි ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.	විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වගන්ති 2.12 හා 2.17 යන දෙකම සඳහන් කරමින් ලිපි ලැබී ඇති බැවින් එය නිරවුල් කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත. නමුත් මේ වන	අදාල ගැටළු කඩිනමින් නිරවුල් කරවාගෙන ණය ශේෂය අදාල වගකිවයුතු පාර්ශවයන් ගෙන් කඩිනමින් අය කරගත යුතුය.

				තෙක් අදාල නිර්දේශ ලැබී නොමැත.	
(ii)	1 කොටසේ XXIV පරිච්ඡේදයේ 4 වගන්ති	108,248	වසර 05 කට වැඩි, වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.	අල්ලස්, දූෂණ චෝදනා යටතේ වැඩ තහනම් වී ඇති අතර, ණය වාරික 12 කින් අයකර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දී ඇතත්, ගෙවීම් පැහැර හැර ඇති බැවින් නීතිපති වෙත අදාල තොරතුරු දන්වා ඇත.	කාලීනව ණය අයකර ගැනීමට පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, එම ණය ශේෂය වගකිවයුතු පාර්ශවයන්ගෙන් කඩිනමින් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(iii)	2 වන කොටසේ XLVIII වැනි පරිච්ඡේදයේ		සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 13 දෙනෙකුගේ අ.පො.ස.(සා. පෙළ) විභාග සහතික සනාථ කළ නොහැකි ඒවා බව විභාග කොමසාරිස් ජනරාල් විසින් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත දන්වා තිබෙන අතර, එම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	නිලධාරී 13 සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනුයේ අදාළ කමිටු තීරණය පදනම් කර ගෙනය.	අදාල නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කඩිනම් පියවර ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.756 (6)		දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 හා 2024 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හඳුනා ගන්නා ලද අයිතම 09 ක ඌණතාවයන් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම උපකරණ අමාත්‍ය කාර්යාලයේ භාවිතා කල අතර, රාජකාරි කටයුතු සඳහා පෞද්ගලික කාර්යාල වෙත තාවකාලිකව රැගෙන යන බවත් නැවත කාර්යාලය වෙත භාර දෙන බවට ප්‍රකාශ කල නමුත් මේ දක්වා එම උපකරණ භාර දීමට කටයුතු කර නොමැත.	කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, මෙම ඌනතාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කඩිනමින් කටයුතු කිරීමත් කළ යුතුය.

(ඇ)	2019 මැයි 31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	බෙන්තොට, අක්මීමන හා වැලිවිටිය දිවිතුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාම වැටුප් ගොනු 63 ක් 2024 දෙසැම්බර් 31 වන දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණි.	නියමිත තොරතුරු සේවය කළ ආයතන මඟින් ගෙන්වා ගැනීමෙන් පසුව කඩිනමින් සකස් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	කාලීනව ලිපිගොනු සංශෝධන නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, අදාළ විශ්‍රාම වැටුප් ගොනු නිශ්චිත කාල රාමුවක් තුල සංශෝධනය කිරීමටත් පියවර ගතයුතුය.

3.3 තැන්පතු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 04 ක එකතුව රු. මිලියන 343.69 ක ශේෂයක් පැවති අතර, එකී ශේෂයන් තුළ රු. මිලියන 2.85 ක වසර 10 ක් ඉක්ම වූ ඉඩම් තැන්පතු 2ක් ද, වසර 02 ඉක්ම වූ රු.මිලියන 19.17 ක වෙනත් තැන්පතු ද පැවතුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	වසර 10 ඉක්මවූ වටිනාකම රු.මිලියන 2.85 ක ඉඩම් තැන්පතු 2 ක් පවති. තවද වසර 02 ඉක්මවූ රු.මිලියන 19.17 ක මුදල නුගදූව ශ්‍රවණාගාර ඉදිකිරීමට අදාල තැන්පතු වේ. අමාත්‍ය මණ්ඩල තීරණය මත තාවකාලිකව නතර කර ඇති මෙම ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් නිදහස් කිරීම හෝ රජයේ අදායමට බැර කිරීම සිදුකල හැක්කේ ව්‍යාපෘති උපදේශක නිර්දේශ ලැබීමෙන් පසුව බව දන්වමි.	පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ග්‍රාමීය මාර්ග වැඩසටහන යටතේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැනිගලයාය මාර්ගය සංවර්ධය කිරීම සඳහා 219 ඩී අලුත්වත්ත ග්‍රාමසේවා වසමේ ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ 2024 ජුලි 24 දින ගිවිසුම්ගත වී තිබුණ ද, 2024 දෙසැම්බර් 09 දින තෙක්ම මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර නොමැති බැවින් අදාළ කටයුතු සඳහා ලද රු.මිලියන 1.45 ක ප්‍රතිපාදන නැවත පවරා තිබුණි.	ප්‍රවාහන මහාමාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ 2024.09.27 දිනැති හා MOH/RRD/PL/01/GEN/2024 දිනැති ලිපිය මගින් එම දිනය වන විට වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව ප්‍රතිපාදන නැවත පවරාදුන් බව.	ව්‍යාපෘතිය ඉටු කර ගැනීමට අපොහොසත් වූ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදනවලින් මහජනතාවට උපරිම සේවාවක් ලැබීම සහතික කරන වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කන්නෙලිය ඇලේ සිට මහබෝධිවත්ත දක්වා පැමිණ හිනිදුම මල්ලිකා විදුහල හා අවට ප්‍රදේශ දක්වා ජලය සැපයීමේ ව්‍යාපෘතිය සඳහා අධිකරණ මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙතින් ලද රු.මිලියනයක ප්‍රතිපාදන මුදල් භාවිතා කර මිලදී ගත් රු.802,650 ක වටිනා ජලනල උපාංග 2020 වර්ෂයේදී තවලම ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි. කෙසේ නමුත් 2025 ජනවාරි 30 දින වනවිටත් හිනිදුම මල්ලිකා විදුහලට මෙම ජල ව්‍යාපෘතිය මගින් ජලය නොලැබෙන බවත් ඒ අවට ප්‍රදේශයට අඛණ්ඩ ජල සැපයුමක් නොලැබෙන බවත් නිරීක්ෂණය විය.	ක්ෂේත්‍ර පරීක්ෂණයේ දි අනාවරණය වූයේ එම ජල නල ප්‍රමාණය එළිමට හැකිවි ඇත්තේ කන්නෙලිය බත්කන වල ජල මූලාශ්‍රයේ සිට හිනිදුම දකුණ ග්‍රාම නිලධාරි වසමේ එච්.එල්.ධනුෂ්ක මහතාගේ නිවස දක්වා වන බවයි. මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන් 150 ක් පමණ ප්‍රතිලාභ ලබන බවත්, 2025 මැයි 31 වන දින වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ප්‍රගතිය වාර්තා කරන බව දන්වා ඇත.	යෝජිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කර අදාළ පියවර ගැනීමටත්, ව්‍යාපෘතිය යෝජිත පරිදි නිම කිරීමට වැඩපිළිවෙලක් යෙදීමත් කළ යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017, 2018, 2019 හා 2021 වර්ෂ වලදී බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බලප්‍රදේශයේ සිදු වූ ස්වාභාවික ආපදා තත්ත්වයන් හේතුවෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 4.75 ක් ලබා දී තිබුණු ප්‍රතිලාභීන් 05 දෙනෙකු නිවාස ඉදිකිරීම අතර මග නවතා දමා තිබූ බැවින් ව්‍යාපෘතියෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණ අතර, රු.මිලියන 6.14 ක් ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 04 දෙනෙකු අදාල නිවාසවල පදිංචි වී නොමැති බවත් නිරීක්ෂණය විය. රු.මිලියන 3.15 ක් ලබාගත් ප්‍රතිලාභීන් දෙදෙනෙකු නිවාස අන්සතු කර තිබීම නිසා අදාල ප්‍රතිලාභින්ගෙන් එම මුදල නැවත අයකර ගැනීමට	අවස්ථා කිහිපයකදීම විකල්ප අවස්ථාවන් තෝරාගන්නා ලෙස දැනුවත් කිරීම් කළද මේ වන තෙක් කිසිදු විකල්පයක් ලබාදී නොමැත. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් මඟින් ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම් දක්වා තොරතුරු ඉදිරිපත් කර ලබාගත් උපදෙස් පරිදි මොවුන් ව්‍යාපෘතියෙන් ඉවත් කිරීමටත්, ඉදිරියේදී ඇතිවිය හැකි ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන ජීවිත හා දේපල හානි සඳහා රජය වග නොකියන බව හා සිදුවන අලාභ හානි පෞද්ගලිකව විඳදරා ගතයුතු බවට ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් නිකුත් කරන චක්‍රලේඛ මාර්ගෝපදේශවල ප්‍රතිලාභීන් ගෙවන	විධිමත් පරීක්ෂණයක් පවත්වා විධිවිධානවලට පටහැනිව කටයුතු කළ ප්‍රතිලාභීන් සම්බන්ධ පියවර ගැනීමටත්, විධිමත් පරිදි නියාමන වැඩපිළිවෙලක් සකසා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමටත් පියවර ගත යුතුය.

උපදෙස් දී තිබුණ ද, 2024 සැප්තැම්බර් 30 වනවිටත් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.	ලද මුදල් නැවත අයකර ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් ඉහත ගැටලු පැන නැගී ඇත.	

4.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේ දී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,154.88 ක් වූ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ආසන 2000 කින් යුත් ශ්‍රවණාගාරය ඉදි කිරීමට අදාළව 2023 මාර්තු 16 දින වනවිට ව්‍යාපෘති උපදේශක විසින් නිර්දේශිත මුළු බිල් පත් වටිනාකම රු.මිලියන 966.72 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට එහි භෞතික ප්‍රගතිය සියයට 15 ක තරම් අඩු මට්ටමක පැවතුණද, එදිනට රු.මිලියන 195.14 ක් නිම කළ වැඩ වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. එසේ ගෙවීමේදී කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ රු.මිලියන 335.09 අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබිය දී තවදුරටත් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 500 ක් ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණි.	අත්තිකාරම් අයකර ගැනීම ව්‍යාපෘති උපදේශකගේ නිර්දේශ අනුව සිදු කරන අතර ඒ අනුව උපදේශක විසින් නිර්දේශ කරන ලද අත්තිකාරම් මුදල් නිරවුල් කරන අතර ඒ අනුව උපදේශක විසින් නිර්දේශ කරන ලද අත්තිකාරම් මුදල් නිරවුල් කරන ලද බිල්පත් වලින් අයකර ගෙන ඇත. ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර කර ඇති බැවින් අවසන් බිල්පත ඉදිරිපත් කරන ලෙස ව්‍යාපෘති උපදේශක වෙත දන්වා ඇති නමුත් මේ දක්වා ඉදිරිපත් කර නොමැත. ඒ අනුව ව්‍යාපෘතිය නතර කිරිම සම්බන්ධයෙන් ව්‍යාපෘති උපදේශකගේ නිරීක්ෂණ ඇතුළත් අවසන් පිළිතුර ඉදිරිපත් කල පසු මෙම අත්තිකාරම් මුදල් අයකර ගැනීමට හැකිවන බව සඳහන් කරමි. සමාලෝචිත වර්ෂය තුළ මෙම ප්‍රතිපාදන වෙන්කර දී තිබෙන්නේ ඉහත කී බිල්පත් පියවීමට සඳහා වන බව කාරුණිකව සඳහන් කරමි.	ගෙවන ලද අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමටත්, මෙතෙක් කර ඇති ඉදිකිරීම් සම්බන්ධයෙන් සුදුසුකම් ලත් පාර්ශවයක් වෙතින් විධිමත් පරීක්ෂාවක් සිදු කර ගෙවීම් සම්බන්ධ තීරණය කිරීමත් කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් හෝල් ඩි ගෝල් ශාලාවේ පවතින කාය වර්ධන මධ්‍යස්ථානයේ රු.මිලියන 7.1 ක කාය වර්ධන උපකරණ පවතින අතර, 2024 වර්ෂයේ මාස 06 ක කාලසීමාවක් තුළ එම උපකරණ පූර්ණකාලීනව භාවිතා කර ඇති බව නිරීක්ෂණය නොවූයෙන් අදාළ උපකරණ ඌණ උපයෝජනය වන බව නිරීක්ෂණය විය.	කාය වර්ධන උපකරණ නිසි ලෙස භාවිතා කිරිම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ඉදිරියේදි සකස් කිරිමට කටයුතු කරන බව දන්වා ඇත.	උපකරණ ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට වැඩපිළිවෙලක් යෙදිය යුතු අතර, ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී එහි තිරසරභාවය පිළිබඳ අවධානය යොමුකළ යුතුය.

4.6 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පින්නදූව හෙළ බොජුන් හල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඇත්තිලිගොඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතියට රු.මිලියන 3.6 ක මුදලකට, ලබා දී තිබූ අතර 2024 මාර්තු 18 දින ආරම්භකර 2024 ජුනි 18 දින එහි වැඩ නිම කිරීමට නියමිතව තිබූ නමුත් ව්‍යාපෘති කාලය 2024 ජුලි 19 දින දක්වා දීර්ඝ කිරීමක් සිදුකර තිබුණි. තවද 2024 ජුනි 19 දින නව කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමේදි කොන්ත්‍රාත් වටිනාකම රු.199,568 කින් වැඩිකර රු.මිලියන 3.8 කට ලබාදී තිබුණි. කෙසේ වුවද කාර්යය 2024 ජුලි 15 දින වැඩ අවසන් කර තිබුණ අතර විෂයයන් 03 ක් සඳහා අවසන් බිල්පත මඟින් එකතුව රු.126,064 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	අදාල ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් මෙතෙක් නිදහස් කර නොමැති අතර විගණන නිලධාරින් විසින් පෙන්වා දුන් පරිදි එම වැඩිපුර ගෙවන ලද මුදල් රැඳවුම් මුදලින් අඩුකර ගෙවිමට කටයුතු කරන බව දන්වා ඇත.	කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හා කොන්ත්‍රාත් වටිනාකම සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කිරීමටත්, කොන්ත්‍රාත් අධීක්ෂණය විධිමත් කිරීම හා වැඩිපුර ගෙවන ලද මුදල් රැඳවුම් මුදලින් අඩුකර ගෙවීමටත් කටයුතු කළ යුතුය.

4.7 අනාර්ජීක ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 සහ 2019 වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලද ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 තුළ සමිති 228 ක් පිහිටවුවද, ඉන් සමිති 216 ක්ම 2024 දෙසැම්බර් 31 දිනට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. මෙලෙස කිසිදු ක්‍රියාකාරකමක් සිදු නොවීම මත 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 110.77 ක මුදලක් මව් සමිති ගිණුම්වලද, ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමේ ද, නිශ්කාර්යව පැවතුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 කින් ග්‍රාමශක්ති සමිති සතු රජයේ අරමුදල් දිස්ත්‍රික් ලේකම්ගේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීමට එකඟතාවය සඳහා නිර්දේශ ලැබී ඇති අතර එම ලිපි ලේඛන අවශ්‍ය අනුමැතිය සඳහා ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය වෙත යොමු කර ඇත.	විධිමත් පරීක්ෂාවක් සිදු කර සමිති සක්‍රීය කර අරමුණු ඉටු කිරීමට හෝ අරමුදල් විධිමත් පරිදි පවරා ගැනීමට හෝ කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ළමා හා කාන්තා කාර්යාංශය මගින් 2005 වර්ෂයේ දී හඳුන්වා දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කරනු ලැබූ චක්‍රීය ණය වැඩසටහන මගින් ගාල්ල දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක 2024 දෙසැම්බර් 31 දිනට අදාළ බැංකු ගිණුම් 15 ක රු.මිලියන 3.52 ක මුදල් ශේෂයක් ණය මුදල් ලබා දීම සඳහා භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.	මේ වන විට අදාල කාර්යාල වල නැවත චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.	ආදායම් උත්පාදන පුහුණුව ලබා දී චක්‍රීය ණය වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කල යුතුය.

4.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 08 දෙනෙකු මුල් පත්වීම් දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 25 – 29 ත් අතර කාලයක් ගත වී තිබුණ ද, එම නිලධාරීන්ගේ විභාග ප්‍රතිඵල සනාථ කර ගෙන නොතිබුණි.	ගැටළුසහගත ප්‍රතිඵල අයත් නිලධාරීන් 8 දෙනෙකු සම්බන්ධයෙන් 2022/09/21 දිනැති ලිපිය හා 2022/03/03 දිනැති කමිටු තීරණය පරිදි අදාළ කටයුතු කර ඇත.	විභාග ප්‍රතිඵල සනාථ කර ගැනීම කඩිනම් කල යුතුය. මෙම කාර්යය අතපසු කළ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ 2017 වර්ෂයේ දී සිදු වූ ගංවතුර ආපදා තත්ත්වයක් හේතුවෙන් පූර්ණ හානි සිදු වූ ප්‍රතිලාභීන් 04 දෙනෙකු සඳහා නැවත	අසාදු ලේඛනගත කිරීමත්, ආපදා සහන සේවා අධ්‍යක්ෂ වෙතින් ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා සිටීම හා අවශ්‍ය ඉදිරි කටයුතු කරමින් පවතින බව.	අදාළ නිලධාරීන් වෙතින් උපදෙස් ලබාගෙන ප්‍රතිලාභීන් නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කල යුතුය.

	පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2024 සැප්තැම්බර් 30 දිනට රු.මිලියන 4.24 ක් ගෙවා තිබුණද, විවිධ හේතු නිසා දරන ලද වියදමින් අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු වී නොතිබුණි.		
(ඇ)	2013 අංක 01 දරන පාර්ලිමේන්තු පනතින් හා 2014 අප්‍රේල් 02 දිනැති අංක 14/0430/51/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එවකට සමෘද්ධි අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් පසුව පිහිට වූ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඔවුන්ගේ මුල් පත්වීම් දින සිට ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරීයෙකු ලෙස අන්තර්ග්‍රහනය වී තිබියදී එම නිලධාරීන්ගේ මුල් පත්වීම දින සිට වැන්දඹු /පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී අරමුදලේ සාමාජිකත්වය ලබාගත යුතු වුවත්, ගාල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලයේ නිලධාරීන් 54 දෙනෙකුගෙන් එලෙස අයවිය යුතු රු.මිලියන 5.6 ක දායක මුදල් අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් වන ඉදිරි කටයුතු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන බැවින් මෙම විගණන විමසුම එම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිම සුදුසු බව යෝජනා කරමි.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී අදාළ දායක මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ට අයත් සමෘද්ධි ප්‍රජා මූල බැංකු 69 මගින් ගනුදෙනුකරුවන් 25,566 ක් වෙත ලබා දී තිබූ එකතුව රු.මිලියන 433.57 ක් වූ මුදලක් කල් පසු වූ ණය ලෙස පැවති අතර, තවත් ගනුදෙනුකරුවන් 4979 ක් වෙත ගෙවා තිබුනු එකතුව රු.මිලියන 341.32 ක් බොල් ණය ලෙස හඳුනා ගෙන තිබුණි. මෙම කල් පසු වූ ණය සහ බොල් ණය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2025.03.31 දින වන විට දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු 69 හි කල්පසු ණය රු.මිලියන 37.58 ක මුදලක් අඩු වී ඇති අතර, බොල්ණය රු.මිලියන 35.10 කින් වැඩි වී ඇත. මේ වන විට බැංකු සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල කල්පසු ණය හා බොල්ණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	කාලීනව ණය අයකර නොගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කිරීමටත්, කල් පසුවූ ණය හා බෝල් ණය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් නීතිමය හා උපායමාර්ගික ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කල යුතුය.

(ඉ)	අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට නාඩු සහල් කිලෝ ග්‍රෑම් 10 බැගින් මාස 02 ක කාලයක් සඳහා බෙදා දීමට ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ප්‍රතිලාභීන් 149,871 දෙනෙකු වෙනුවෙන් එහි පළමු අදියර සඳහා සහල් කිලෝග්‍රෑම් 1,498,710 ක් 2024 අප්‍රේල් මස මිලදී ගෙන තිබුණි. යථෝක්ත චක්‍රලේඛයෙහි සහල් කිලෝග්‍රෑමයක උපරිම මිල රු.186 ක් ලෙස දක්වා තිබුණ ද, එම කාලච්ඡේදය තුළ පාරිභෝගික භාණ්ඩ මිල වාර්තා අනුව වෙළඳපොල නාඩු කැකුළු සහල් කිලෝවක මිල රු.158 ත් රු.175 ක් වූයෙන් සහල් මිලදී ගැනීමේ දී රජයට රු.මිලියන 12.80 ක මුදලක් අතිරේකව ගෙවීමට සිදුවී තිබුණි.	උක්ත චක්‍රලේඛයේ 2.3.2 සඳහන් කර ඇති පරිදි සහතික මිල ගණන් යටතේ ප්‍රමිතියෙන් යුතු සහල් මිලදී ගැනීම සිදු කල බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා මූල්‍ය ගනුදෙනු නිසි පිරිමැසුම්භාවයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් රජයට සිදු වී ඇති පාඩුව නිශ්චය කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ප්‍රතිලාභීන් 90 දෙනෙකු සඳහා එළුවන් 270 ක් ලබා දීමට රු.මිලියන 6.74 ක් වැයකර තිබුණු අතර, ඉන් එළුවන්ගෙන් 44 දෙනෙකු මිය ගොස් තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක සතුන් මිය යෑමේ ප්‍රතිශතය සියයට 33 ත් 58 ත් අතර අගයක් ගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ජමුනාපාරි දෙමුහුන් එළුවන් ලබා දීම තුලින් සත්ත්ව අභිජනනය සහ පැටවුන් විකිණීමෙන් හා එළුකිරි විකිණීමෙන් ආදායම් ඉපයීම ව්‍යාපෘතියේ අරමුණු වුවද, පැටවුන් බිහි කිරීම අවම මට්ටමක පැවතීම හා බිහි වන පැටවුන් මිය යාම මෙන්ම අපේක්ෂා කල පරිදි ප්‍රමාණවත් කිරි ආදායමක් ලබාගෙන නොතිබූ බැවින් මෙම වැඩසටහනින් තවදුරටත් නිරීක්ෂණය වූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටු වීම ප්‍රශස්ථ මට්ටමක නොතිබුණි.	ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියට අදාළ පසු විපරම් කටයුතු හා ප්‍රතිලාභීන්ට අවශ්‍ය මඟ පෙන්වීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මට්ටමෙන් නිරන්තරයෙන්ම සිදු කරන අතර, අවශ්‍ය උපදෙස් ලබා දීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය මඟින් ද ඉන් ඔබ්බට කෘෂිකර්ම අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය සම්බන්ධීකරණය කර ගනිමින් ද නිරන්තරව සිදු කරනු ලබයි.	අදාළ සියළුම ආයතන සම්බන්ධීකරණය කර කඩිනම් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.
(උ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ගණනය කිරීමේ දෝෂ, වංචනික කටයුතු හෝ වෙනත් කරුණු මත වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් වලින් 2024 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගැනීමට ඇති ශේෂය රු.මිලියන 8.87 ක් විය.	වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් තවදුරටත් අය කරමින් පවතී.	වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, හඳුනාගත හැකි වංචනික කටයුතු සඳහා නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි 03 සිට 2024 දෙසැම්බර් 11 දින දක්වා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මහජන පැමිණිලි 140 ක් පමණ ලැබී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් දිනය වනවිට ඉන් පැමිණිලි 44 ක් සම්බන්ධයෙන් අවසාන නිගමනයකට පැමිණ නොතිබුණු අතර, එය ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 31 ක් විය.	මහජනතාව වෙතින් ලැබෙන පැමිණිලි අදාල අංශ වලට කඩිනමින් යොමුකර විසඳීමට කටයුතු කෙරේ.	මහජන පැමිණිලි පිළිබඳව කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත්, ලැබී ඇති පැමිණිලි සඳහා කඩිනමින් කටයුතු කර ඵලදායී විසඳුම් ලබා දීමත් කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල වල කාර්ය මණ්ඩලයෙහි 266 ක පුරප්පාඩු පැවතුණි.	විධිමත් පරිදි පුරප්පාඩු පිරවීමේ බලය දිස්ත්‍රික් ලේකම් වෙත නොමැති බැවින් එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා වන වාර්තා අදාළ බලධාරීන් වෙත යැවීම සිදු කර ඇත.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍යම පුරප්පාඩු පමණක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	අංක 18/2001 හා 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාලසීමාව වන අවුරුදු 05 ක් එකම තනතුරේ / එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් තනතුරු වල / සේවා ස්ථාන වල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථාන මාරු ලබා දිය යුතු බව සඳහන් වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි සේවය කරන නිලධාරින් 78 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	සහකාර අධ්‍යක්ෂ (සැලසුම් - අධිසේවක) නිලධාරින් සිව් දෙනෙකු වෙනත් සේවයකට අන්තර්ග්‍රහණය වීමෙන්, උසස් වීමෙන්, විශ්‍රාම යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු වී තනතුර අහෝසි වන අතර, නිලධාරීන් 5දෙනෙකු 2025 වාර්ෂික ස්ථානමාරු නියෝග යටතේ ස්ථානමාරු ලබා ඇත.	චක්‍රලේඛ විධිවිධාන හා ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ)	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් 07 දින අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන වලට අනුව III වන ශ්‍රේණියට බඳවා ගත් නිලධාරියකු පත්වීමේ දින සිට වසර 03 ගත වීමට පෙර 1 වන කාර්යක්ෂමතා විභාගය සමත් විය යුතු වුවද, නිලධාරීන් 04 දෙනෙකු විගණන දිනය වන විටත් මුල් පත්වීම් ලබා වසර 25 ත් 29 ත් අතර කාලයක් ගතව පැවතිය ද, කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී නොතිබුණි.	මේ වන විට කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව ඇති බව වාර්තා කර ඇත.	මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය.